**ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය**

# පැවරුම් කාර්යය වාර්තාව (TOR)

**තනතුරු නාමය** - ශාලාධිපති

**ස්වාමින් වහන්සේගේ නම** -

**වගකිවයුතු නිලධාරියා** - මහෝපාධ්‍යායයන් වහන්සේ

**ශාලාධිපති තනතුරේ රාජකාරි ලැයිස්තුව**

1. නේවාසිකාගාර තුළ ශිෂ්‍යයන්ගේ විනය පවත්වාගෙන යාම.
2. ශිෂ්‍ය විනය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව - 2023 අංක 04 මගින් නියම කර ඇති නීති රීති ක්‍රියාත්මක කිරීම.
3. පහත සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමු කිරීම ඔබගේ වගකීම වේ.
   i. නේවාසිකාගාර තුළ සිදු විය හැකි නවක වදය සහ අනෙකුත් හිරිහැර වැළැක්වීම.
   ii. නේවාසිකාගාර තුළ පවතින විශ්වවිද්‍යාලයීය දේපල සුරක්ෂිත කිරීමට විධි විධාන සැලැස්වීම.
   iii. අවසර නොලත් පුද්ගලයින් නේවාසිකාගාර තුළ කිසිදු අවස්ථාවක රැඳී නොසිටීමට වග බලා ගැනීම.
4. නේවාසිකාගාරයේ සිටින ශිෂ්‍යයන් සමග මසකට වරක් රැස්වීම් පැවැත්වීම.
5. නේවාසිකාගාර කළමනාකරණයට අදාළ රාජකාරි ඉටු කිරීම සඳහා පූර්ණ කාලීන උපශාලාධිපති ඇතුළු විශ්වවිද්‍යාලයේ ශිෂ්‍ය සුභසාධන අංශය භාර නිලධාරියාට සහ අනෙකුත් අදාළ නිලධාරින්ට හා සේවකයින්ට පූර්ණ මාර්ගෝපදේශනය ලබා දීම.
6. නේවාසික සිසුන්ගේ කුසලතා හා ආකල්ප සංවර්ධනය සඳහා අවශ්‍ය මගපෙන්වීම ලබා දීම.
7. කථිකාචාර්ය නේවාසිකාගාර කටයුතු සම්බන්ධයෙන් පාලන අංශය සමග එක්ව කටයුතු කිරීම.

**ශිෂ්‍ය විනය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව - 2023 අංක 04 ප්‍රකාරව ශාලාධිපති තනතුරේ බලතල**

(i) අදාළ නේවාසික ශාලාවේ උපශාලාධිපතිවරයාගේ සහාය ඇතිව නේවාසික ශාලාව තුළ සිටින සියලු ම සිසුන්ගේ විනය එම පරිශ්‍රය තුළ පවත්වාගෙන යාමේ වගකීම ශාලාධිපති සතු වේ.

නේවාසිකාගාරයක ශාලාධිපතිවරයෙකුගේ බලතල වනුයේ,

(ii) අ. නේවාසිකාගාරයේ ශිෂ්‍යයන් අතර විනය පවත්වා ගැනීම හා නේවාසිකාගාරයේ ශිෂ්‍ය

විනයට අදාළ වන කරුණු සම්බන්ධයෙන් මහෝපාධ්‍යායයන් වහන්සේ, විනය පාලක, සමග සාකච්ඡා කොට ඒ පිළිබඳ කටයුතු කිරීම.

ආ. සිදුව ඇති විනය කඩකිරීම බරපතල තත්වයේ එකක් නොවන අවස්ථාවක දී ඒ පිළිබඳ ඔහු විසින්ම මූලික විමර්ශනයක් පවත්වා පහත සඳහන් දඬුවම් අතරින් එකක් පනවා උචිත ක්‍රියාමාර්ග ගැනීම.

| | |
|---|---|
| අ) | සති දෙකක් නොඉක්මවන කාල පරිච්ඡේදයක් සඳහා නේවාසිකාගාරයට පැමිණීම අත්හිටුවීම. |
| ආ) | ලිඛිත අවවාද කිරීමක්. |

ඇ. ශාලාධිපතිවරයා විසින් ඉහත විධිවිධාන යටතේ කටයුතු කරන සෑම අවස්ථාවකම මහෝපාධ්‍යායයන් වහන්සේගේ එකගතාව සඳහා වාර්තාවක් විනය පාලකවරයාට ද පිටපත් සහිතව ඉදිරිපත් කළ යුතුය.

ඈ. දඬුවම පැනවීමට අදාළ ලිපියේ පිටපතක් දඬුවම් ලැබූ ශිෂ්‍යයා/ශිෂ්‍යයන්ගේ භාරකාර ස්වාමීන් වහන්සේට යැවීම හා පෞද්ගලික ලිපිගොනුවේ වාර්තා ගතකර තැබීම සඳහා එම ශිෂ්‍යයා/ශිෂ්‍යයන්ගේ පීඨයේ පීඨාධිපති/ පීඨාධිපතිවරු මගින් ශිෂ්‍ය සේවා අංශය වෙත යැවීම.

(iii) ශාලාධිපති විසින් පවත්වනු ලබන විමර්ශනයෙන් ඉහත සඳහන් දඬුවම් පැනවීම මගින් ප්‍රමාණවත් පරිදි විසඳාගත නොහැකි බරපතල විනය විරෝධී සිද්ධීන් අනාවරණය වන අවස්ථාවකදී, ශාලාධිපති විසින් එම කාරණය මූලික පරීක්ෂණයක් පැවැත්වීම සඳහා විනය පාලකවරයා වෙත ඉදිරිපත් කළ යුතු අතර, ඔහුගේ සොයාගැනීම් සහ නිර්දේශ මෙම අතුරු ව්‍යවස්ථා යටතේ සුදුසු ක්‍රියාමාර්ගයක් ගැනීම සඳහා මහෝපාධ්‍යායයන් වහන්සේ වෙත යොමුකළ යුතු වේ.

(iv) විනය විරෝධී ක්‍රියාවක නිරත වූ කිසියම් ශිෂ්‍යයෙකු/ශිෂ්‍යයන්ට විශ්වවිද්‍යාලය තුළ රැඳී සිටීමට අවසරදීමෙන් නේවාසිකාගාරයේ හෝ විශ්වවිද්‍යාලයේ සුමට ක්‍රියාකාරිත්වයට හා සුහදශීලි වාතාවරණයට අහිතකර වනු ඇතැයි ශාලාධිපතිට හැඟී යන්නේ නම් උන්වහන්සේ එම කාරණය පිළිබඳ උචිත ක්‍රියාමාර්ගය ගැනීම සඳහා මහෝපාධ්‍යායයන් වහන්සේ වෙත ඉදිරිපත් කළ යුතු වේ.

............................................................................ ..........................................
මහෝපාධ්‍යායයන් වහන්සේ දිනය

මෙම කාර්යය පැවරුමට අදාළ රාජකාරි තේරුම්ගත් බවටත් ඊට අදාළව රාජකාරි ඉටු කරන බවටත් මෙයින් සහතික වෙමි.

................................................................... ............................................
ශාලාධිපති දිනය